**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 12/95**

මගේ අංකය: Iv -2/9/361/5(එච්)2
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත හා
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07
1995.03.17 දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානයන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

**1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැලැක්වීමේ (තාවකාලික විධිවිධාන) පණත යටතේ සහ හදිසි නීති යටතේ අත්අඩංගුවට ගන්නා ලද නිලධරයන්/ සේවකයන් නැවත සේවයේ පිහිටුවීම**

උක්ත කරුණ පිළිබඳව නිකුත් කර ඇති 1989.10.06 දිනැති අංක: 48/89 හා 1991.04.10 දිනැති අංක 48/89 (1) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වෙනුවට මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව (මූලික පරීක්ෂණයක නිගමන පදනම් කොටගෙන) පවත්වනු ලබන විධිමත් පරීක්ෂණයකින් පසුව පහත දක්වා ඇති වර්ගවලට අයත්වන රාජ්‍ය නිලධරයන්/රාජ්‍ය සංස්ථා සේවකයන් නැවත සේවයේ පිහිටුවිය යුතුය.

(I) 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැලැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත සහ/හෝ හදිසි අවස්ථා රෙගුලාසි යටතේ අත් අඩංගුවට ගනු ලැබූ සහ සාක්ෂි නොමැතිකමින් විෂයට අදාල ඇමතිවරයා විසින් හෝ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් මුදහරිනු ලැබූ හෝ හදිසි අවස්ථා රෙගුලාසි 18 හෝ 19 යටතේ පොලිස්පතිවරයා විසින් අත්අඩංගුවට ගනු ලැබූ හෝ නිලධරයන්/සේවකයන්,

(II) ඉහත සඳහන් පනත/හදිසි රෙගුලාසි යටතේ නඩු පවරනු ලැබූ පසුව අධිකරණයකින් නිදෙස් කරනු ලැබූ හෝ අධිචෝදනා ඉල්ලා අස්කර ගැනීම නිසා මුදහරනු ලැබූ නිලධර/සේවකයන්,

(III) ඉහත සඳහන් පනත/හදිසි රෙගුලාසි යටතේ අධිකරණයේදී වරදකරුවන් වූ නිලධරයන්/සේවකයන්,

(IV) විෂය භාර අමාත්‍යවරයා විසින් හෝ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ මුදහරින ලදුව, ඉන්පසු ඔවුන් මුලදී අත්අඩංගුවට ගැනීමට හේතු වූ වරදම සම්බන්ධයෙන් අධිකරණයක නඩු පවරනු ලැබ ඊට වරදකරුවන් වූ නිලධරයන්/ සේවකයන්,

(V) අධිචෝදනා නිවර්තනය මත ගරු නීතිපති විසින් අදාල අධිචෝදනා ඉල්ලා අස්කර ගන්නා ලද්ද වූ නිලධරයන්/ සේවකයන්,

(VI) අත්අඩංගුවට ගෙන සිටි හෝ පොලිසියට හෝ රජය විසින් පත්කොට ඇති වෙනත් බලධරයෙකුට හෝ බාරවී සිටි සහ ඉහත (II ), (III), (IV) සහ (V) යන වර්ගයන්ට අයත් නොවන එහෙත් පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් විසින් පුනරුත්ථාපනය කිරීම සඳහා රඳවාගෙන සිටි නිලධරයන්/සේවකයන්,

**03.** කෙසේ වුවද ඉහත (I), (II), සහ (V) වර්ගයට ගැනෙන නිලධරයන්ට/ සේවකයින්ට පූර්ව යහපත් සේවා වාර්තාවක් තිබේ නම් අදාල අමාත්‍යවරයාගේ ද එකගත්වය ඇතිව විධිමත් පරීක්ෂණයකින් තොරව ඔවුන් නැවත සේවයේ පිහිටුවිය හැකිය. එබඳු නිලධරයන්ගේ/සේවකයන්ගේ රඳවා ගැනීමේ කාලය සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ලෙස සැලකිය යුතුය.

**04.** ඉන්දියානු සාම සාධක හමුදාව විසින් අත් අඩංගුවට ගෙන පසුව නිදහස් කරනු ලැබ ඇති නිලධරයන්ද / සේවකයන්ද නැවත සේවයෙහි පිහිටු විය යුතු අතර, ඔවුන්ගේ රඳවා ගැනීමේ කාලය සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ලෙස සැලකිය යුතුය.

**05.** 1971 කැරැල්ල සම්බන්ධයෙන් රඳවාගනු ලැබූ සහ නැවත සේවයේ පිහිටුවා නොමැති නිලධරයන් / සේවකයන් සම්බන්ධයෙන් එබඳු එක් එක් අය පිළිබඳව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සමග සාකච්ඡා කොට අදල ඇමතිවරයාට ඒ පිළිබඳව සලකා බැලිය හැකිය.

**06.** (III) වර්ගයට අයත් නිලධරයන් / සේවකයන් සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පැවැත්වීමට ප්‍රමාණවත් සාක්ෂි /සාධක නොමැති අවස්ථාවලදී හා ඔවුනට පූර්ව යහපත් සේවා වාර්තාවක් ඇති විටදී අදල අමාත්‍යවරයාගේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ එකගත්වය ලබා ගැනීමෙන් පසුව එම තනතුරුවල ඇබෑර්තු ඇතිවන විටදී ඔවුන් නැවත සේවයේ පිහිටුවිය හැකිය. ඔවුන් සේවයේ නොසිටි කාලය වැටුප් රහිත නිවාඩු ලෙස සැලකිය යුතුය.

07. (IV) වර්ගයට අයත් නිලධරයන්ට / සේවකයන්ට පූර්ව යහපත් සේවා වාර්තාවක් තිබේ නම් අදාල අමාත්‍යවරයාගේ එකගත්වය ඇතිව විධිමත් විනය පරීක්ෂණයකින් තොරව ඔවුන් නැවත සේවයේ පිහිටුවිය හැකිය. ඔවුන් සේවයේ නොසිටි කාලය වැටුප් රහිත නිවාඩු සේ සැලකිය යුතුය.

08. (VI) වර්ගයට අයත් නිලධරයන්ට/සේවකයන්ට පූර්ව යහපත් සේවා වාර්තාවක් තිබේ නම් අදාල අමාත්‍යවරයාගේ එකගත්වය ඇතිව විධිමත් විනය පරීක්ෂණයකින් තොරව ඔවුන් නැවත සේවයේ පිහිටුවිය හැකිය. ඔවුන් සේවයේ නොසිටි කාලය වැටුප් සහිත නිවාඩු සේ සැලකිය යුතුය.

09. අත්අඩංගුවට ගෙන නීතිමය නඩු විභාගයක් ගෙන යාමට හැකියාවක් නොමැතිවීම නිසා නිදහස් කරන ලද හෝ උත්තරණය කරන ලද පූර්ව යහපත් සේවා වාර්තාවක් ඇති නිලධරයන් සේවකයන් අදල අමාත්‍යවරයාගේ එකගත්වය ඇතිව විධිමත් විනය පරීක්ෂණයකින් තොරවනැවත සේවයේ පිහිටුවිය යුතු අතර, ඔවුන් රඳවා ගැනීමේ කාලය සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු සේ සැලකිය යුතුය.

10. අත්අඩංගුවට ගෙන නීතිමය නඩු විභාගයක් ගෙන යාමට හැකියාවක් නොමැතිවීම නිසා නිදහස් කරන ලද හෝ උත්තරණය කරන ලද එහෙත් පූර්ව යහපත් සේවා වාර්තාවක් නොමැති නිලධරයන් / සේවකයන් විධිමත් විනය පරීක්ෂණයකින් තොරව අදල අමාත්‍යවරයාගේ එකගත්වය ඇතිව නැවත සේවයේ පිහිටුවිය යුතු අතර, නැවත සේවයේ පිහිටු වූ දින සිට වසරක පරිවාස කාලයකට යටත් කලයුතුය. තව ද සේවයේ නොසිටි කාලය සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු සේ සලකා ක්‍රියා කලයුතුය.

11. ඉහත 02 (I), (II), (V) සහ (VI) යන ඡේදයන්හි සඳහන් නිලධරයන්ට / සේවකයන්ට පූර්ව යහපත් සේවා වාර්තාවක් නොමැති විටදී විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්විය යුතුය. එහි නිගමන අනුව නිලධරයා/සේවකයා යලි සේවයේ පිහිටුවීමට විනය බලධරයා තීරණය කරන්නේ නම් වසරක පරිවාස කාලයකට යටත්ව සේවයේ පිහිටුවිය යුතුය. සේවයේ නොසිටි කාලය සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු සේ සැලකිය යුතුය.

12. තව ද, ඉහත 02 (III) හා (IV) යන ඡේදයන්හි සඳහන් නිලධරයන්ට / සේවකයන්ට පූර්ව යහපත් සේවා වාර්තාවක් නොමැති විටදී විධිමත් විනය පරීක්ෂණයක්පැවැත්විය යුතුය. එහි නිගමනය අනුව නිලධරයා/සේවකයා යලි සේවයේ පිහිටුවීමට විනය බලධරයා තීරණය කරන්නේ නම් වසරක පරිවාස කාලයකට යටත්ව සේවයේ පිහිටුවිය යුතුය. සේවයේ නොසිටි කාලය වැටුප් රහිත නිවාඩු සේ සැලකිය යුතුය.

13. මෙම චක්‍රලේඛය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ එකගත්වය ඇතිව නිකුත් කෙරේ.

**අ.කලේ/(ආර්.එස්.ජයරත්න)**
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය ලේකම්